30

# පොළොන්නරුව වටදාගෙයි ආකෘතියෙන් පිළිබිඹු වන පංචධ්‍යානී බුද්ධ මණ්ඩලය

*ආර්. පී. ආශා නිරෝෂණී* [1]

*යූ. ඩී. නිසංසලා සෙව්වන්දි* [2]

HS/2013/0701, HS/2013/1013

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පොළොන්නරුව වටදාගෙයි ආකෘතිය සඳහා පංචධ්‍යානී බුද්ධ මණ්ඩල සංකල්පය බලපා තිබේ ද යි යන්න විමසීමට ලක් කිරීමයි.මහා පැරකුම්බා රජු විසින් කරවා නිශ්ශංකමල්ල රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලදැ යි සැළකෙන වටදාගෙය, ථූපඝරය, ස්ථූපඝරය යන නම්වලින් හඳුනා ගැනෙන සුවිශේෂී ගොඩනැගිල්ලකි. ආකෘතිකමය වශයෙන් සළකා බලන කළ පොළොන්නරු වටදාගෙය සුවිශේෂී වන්නේ මෙය පිහිටි දළදා මළුවේ අනෙක් කිසිදු ගොඩනැගිල්ලක නැති ආකෘතිමය ලක්ෂණ මෙහි පැවතීමයි. දළදා මළුවේ නිශ්ශංකලතා මණ්ඩපය, හැටදාගෙය, අටදාගෙය, ථූපාරාමය ආදී ගොඩනැගිලි චතුරස්‍රාකාර ආකෘතියකින් යුතුවන අතර වටදාගෙය වෘත්තාකාර හා දෙමහල් වේ. මෙහිදී වටදාගෙය හා පංචධ්‍යානී බුද්ධ මණ්ඩලය පිළිබඳ ව ලියැවුණු සාහිත්‍යමය මූලාශ්‍ර අධ්‍යනය කරන ලදී. ඒ අනුව අනුරාධපුර යුගයෙහි ශ්‍රී ලංකාවේ ස්ථාපිතව තිබූ මුල් බෞද්ධාගමික ලක්ෂණවලට මහායානික ලක්ෂණ අවතීර්ණ වීමත් ප්‍රධාන බෞද්ධාගමට අමතරව හින්දු ආගමට ප්‍රමුඛතාවක් ලැබීමත් සුවිශේෂි වේ. පොත්ගුල් විහාරයේ (1වන බුදු පිළිමය වටා දක්නට ලැබෙන විමාන හතර) පිළිම සඳහා ද මෙම මහායාන සංකල්ප බලපා ඇති බව දැකිය හැක. මහායානික තන්ත්‍රයාන ග්‍රන්ථයක් වූ "සාධනමාලා" ග්‍රන්ථයේ හැඳින්වෙන පරිදි වෛරෝචන, අමෝඝ සිද්ධි, අමිතාභ අක්ෂෝභය, රත්න සම්භව යන පංචධ්‍යානී බුද්ධ මණ්ඩලය වේ. ඒ අනුව අවලෝකිතේශ්වර බුදුන් ප්‍රමුඛ කොට ගෙන අනිත් බුදුවරුන් ඒ වටා යෙදීම රීතියක් විය. එබැවින් පොළොන්නරුවේ ස්තූප ඉදි කිරීමේ දී ධාතු තැන්පත් කරනු ලැබූ චෛත්‍ය අවලෝකිතේශ්වර බුදුන් සේ සළකා ගෙන අනෙක් බුදුවරුන් සතර දෙනා සතර දිශාවට මුහුණලා දක්වා ඇත. පොළොන්නරු වටදාගෙයි ආකෘතිය සැලැසුම් කිරීමේ දී බුදු පිළිමයත්, ස්තූපයත් ආවරණය වන සේ ඉදි කර ඇත. ස්තූපය කේන්ද්‍ර කොට ගෙන ඒ වටා කුළුණු පේළි ස්ථානගත කරමින් වහලයක් තනා තිබෙනන්ට ඇති බව පැහැදිලි ය. මේ අනුව පොළොන්නරු වටදාගෙයි ආකෘතිය අනිකුත් ගොඩනැගිලි ආකෘතීන් අතරින් වෙනස් වීමට මහායාන පංචධ්‍යානී බුද්ධ සංකල්පය බලපාන්නට ඇති බව නිගමනය කළ හැක.

ප්‍රමුඛ පදඃ ස්තූප ආකෘතිය, පොළොන්නරුව, වටදාගෙය, පංචධ්‍යානී බුද්ධ මණ්ඩලය, මහායාන බුදු දහම

---

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදි) ප්‍රථම වසර*

*2 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදි) ප්‍රථම වසර*